දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின்-அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/01/05-11/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.09.02

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>සේවා ව්‍යවස්ථා හා බඳවාගැනීමේ පටිපාටි සංශෝධනය කිරීම</u>

රාජ්‍ය සේවයේ එක් එක් තනතුරු හා සේවාවන් සඳහා දැනට අනුමත කර ඇති සේවා ව්‍යවස්ථා හා බඳවාගැනීමේ පටිපාටිවල වරින් වර සංශෝධන ගණනාවක් සිදු කර ඇති බැවින් පරිශීලනය අපහසු බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

02. ඒ අනුව එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු මගින් සකස් කර, දැනට අනුමත කරවා ගෙන ඇති සේවා ව්‍යවස්ථා හා බඳවාගැනීමේ පටිපාටිවල සංශෝධන තුනකට වඩා සිදුකර ඇත්නම් එම සියළු සංශෝධන ඒකාබද්ධ කරමින් සේවා ව්‍යවස්ථාව / බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර සහතික කිරීම සඳහා මාසයක් තුළ ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

03. එලෙස සංශෝධන ඒකාබද්ධ කර සේවා ව්‍යවස්ථාව / බඳවා ගැනීමේ පටිපාටිය සැකසීමේදී සංශෝධනය අනුමත කරන ලද දිනය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලිපි අංකය එක් එක් වගන්තිය අසල පැති සටහනක් යොදමින් සකස් කළ යුතු වේ.

04. තවද අදාළ සේවා ව්‍යවස්ථාව / බඳවා ගැනීමේ පටිපාටිය මෙම කාර්යාලය වෙත එවීමේදී එම මෘදු පිටපත establishment@psc.gov.lk ඊමේල් ලිපිනය වෙත යොමු කරන ලෙසද කාරුණිකව දන්වමි. (කෙටුම්පත සකස් කිරීමේදී Unicode – Iskola potha භාවිතා කරන්න)

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව